# වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

## රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය භාවිතා කරන ලද පහත සඳහන් සුඛෝපභෝගී වාහන, ලියාපදිංචි රථ ලෙස භාවිතා කළ හැකිවන පරිදි හා අමතර කොටස් ලෙස භාවිතා කළ හැකිවන පරිදි ලංසු කැඳවා විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

**වාහන විකිණීම**

| වාහන අංකය | වාහන වර්ගය හා මාදිලිය | නිෂ්පාදිත වර්ෂය | ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ලේඛන ගාස්තුව (රු.) | ආපසු ගෙවන තැන්පතුව (රු.) |
|---|---|---|---|---|
| CAT 8228 | Audi - A8 3.0L | 2016 | 5,000.00 | 50,000.00 |
| KV 0618 | Toyata - Land Cruiser | 2012 | 5,000.00 | 50,000.00 |
| KP 0914 | Toyata - Land Cruiser | 2011 | 5,000.00 | 50,000.00 |
| KQ 2196 | Toyata - Land Cruiser | 2011 | 5,000.00 | 50,000.00 |
| KS 5534 | BMW - 5201 | 2011 | 5,000.00 | 50,000.00 |
| KQ 7809 | Nissan-Teana | 2011 | 5,000.00 | 50,000.00 |
| GP 3121 | Toyata - Land Cruiser | 2002 | 5,000.00 | 50,000.00 |
| GD 7246 | Nissan - Petrol | 2000 | 5,000.00 | 50,000.00 |
| 301-1410 | Toyata - ELOR AEMDS | 1999 | 5,000.00 | 50,000.00 |
| KK 5267 | Nissan - X - Trail | 2011 | 5,000.00 | 50,000.00 |
| KU -7910 | Toyata - Land Cruiser | 2012 | 5,000.00 | 50,000.00 |

**වාහන අමතර කොටස් විකිණීම**

| ලොට් අංකය | වාහන වර්ගය හා මාදිලිය | නිෂ්පාදිත වර්ෂය | ආපසු ගෙවනු නොලබන ටෙන්ඩර් ලේඛන ගාස්තුව (රු.) | ආපසු ගෙවන තැන්පතුව (රු.) |
|---|---|---|---|---|
| 01 | Mahindra - Bolero 4wd | 2006 | 3,000.00 | 5,000.00 |

එක් එක් වාහනය සඳහා ආපසු නොගෙවනු ලබන උක්ත වගුවල සඳහන් ටෙන්ඩර් පත්‍රිකා ගාස්තුව හා ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල් ගෙවා **2025.08.25** දින සිට **2025.09.15** දින දක්වා කාර්යාලයීය දිනයන්හි **පෙරවරු 9.00** සිට **පස්වරු 3.00** අතර කාලය තුළ පහත ලිපිනයෙහි පිහිටි **"නිල මැදුර"** ගොඩනැගිල්ලේ 16 වන මහලේ, ප්‍රසම්පාදන ශාඛාවෙන් අදාළ ලේඛන ලබා ගත හැක. මිල ගණන් එම ලේඛන පත්‍රය මගින් පමණක් ඉදිරිපත් කළ යුතු අතර එක් එක් වාහනය සඳහා වෙන වෙනම මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

මෙම වාහන පහත ලිපිනයෙහි පිහිටි **"නිල මැදුර"** පරිශ්‍රයේ බිම් මහලේදී **2025.08.25** දින සිට **2025.09.15** දින දක්වා කාර්යාලයීය දිනයන්හිදී **පෙරවරු 9.00** සිට **පස්වරු 3.00** දක්වා අතර කාලය තුළ පරීක්ෂා කළ හැක.

සම්පූර්ණ කර මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා **2025.09.16** දින **පෙරවරු 10.00ට** පෙර ලැබෙන පරිදි පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ **"නිල මැදුර"** ගොඩනැගිල්ලේ 16 වන මහලේ, ප්‍රසම්පාදන ශාඛාවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලීම හෝ සිදු කළ හැකිය. මිල ගණන් ඉදිරිපත් කරනු ලබන කවරයේ වම් ඉහළ කෙළවරේ **"වාහන විකිණීම සඳහා වූ ටෙන්ඩරය"** යනුවෙන් සහ **"වාහන අංකය හෝ ලොට් අංකය"** සඳහන් කළ යුතුය.

ටෙන්ඩර් භාර ගැනීම **2025.09.16** දින **පෙරවරු 10.00** ට අවසන් වන අතර ටෙන්ඩර් විවෘත කිරීම **2025.09.16** දින **පෙරවරු 10.00 ට** 19 වන මහලේදී සිදු කරනු ලැබේ. ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර් පත්‍රිකා ප්‍රතික්ෂේප කරනු ලබන අතර ටෙන්ඩර් විවෘත කරන අවස්ථාව සඳහා ලංසුකරුට හෝ බලයලත් නියෝජිතයකුට සහභාගි විය හැකිය.

උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට අවශ්‍ය වැඩිදුර විස්තර ස්වදේශ කටයුතු අංශයේ ප්‍රධාන ගණකාධිකාරී වෙතින් ලබාගත හැක.

**දුරකථන 011-2050411/ 011-2050420**